# ලංකාවිත්ති
# LANKA VITHTHI



මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 14
NUMBER 05

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

August/September 10, 2011 අගෝස්තු-සැප්තැම්බර් මාස (නිකිණි බිනර) http://www.lankaheritage.com/lankaviththi/


# මේ ටික අපටත් වෙන්නට තිබුණා

**කීර්ති ජයසුන්දර විසිනි**

**මේ 2011** වසර ආරම්භයේ සිට මේ දක්වා ගතවූ සමය ලොව සමාජ, ආර්ථික හා දේශපාලනමය වශයෙන් කැළඹීම් රැසකින් පිරී පැවතිණ. මේ කැළඹීම්වල ප්‍රධාන තැනක් ගත්තේ මැදපෙරදිග රටවල් ය. මෙය අරාබි වසන්තය ( **Arab Spring**) යනුවෙන් පුවත්පත්කාරයින් හඳුන්වන්නට පටන්ගත් සිදුවීම් වැලකි. මේහැර ඇමරිකාව, බ්‍රිතාන්‍ය සහ යුරෝපීය සමුළුවේ රටවල්වල ආර්ථික යන් මේ කාලය තුළ **2008** දී සිදුවූ බැංකු පරිහානියට ළංවන ආකාරයේ ගරාවැටීම කට පාත්‍රවන ලකුණු පෙනිණ.

නව සංනිවේදන විප්ලවය වශයෙන් බොහෝදෙනා හඳුන්වන අන්තර්ජාලය සහ ජංගම දුරකතන තුළින් මතුවී ඇති **Face Book, Twitter, e-mail, iPad** ආදී වර්ධන යන් ලොව පුරා, විශේෂයෙන් තරුණ පෙළට, සීඝ්‍රයෙන් පණිවුඩ හා තොරතුරු හුවමාරුව ඉතා ඉක්මනින් පහසුවෙන් හා ලාභයට කරගත හැකි හැකියාව ලබාදුන් අතර, එය ඔවුනට සතුටුසාමීචියට මෙන්ම ඉක්මනින් සංවිධානයවීමේ නව ආයුධයක් ද බවට පත්විය.

## අරාබි වසන්තය – තුනීසියාව

අරාබි වසන්තය නමින් පසුව පුවත්පත්කාර යින් විසින් හඳුන්වන්නට යෙදුණු ඒ කැරලි ගැසීම් ආරම්භ වූයේ **2010** දෙසැම්බර් මාස යේ තුනීසියාවෙනි. **(Tunisia)** අධික ජීවන වියදම, විරැකියා ප්‍රශ්න, රජය මගින් සිදු කරන ලද දේශපාලන මර්දනය හා බලයේ සිටි අයගේ දූෂණ හා අක්‍රමිකතා ආදී ප්‍රශ්න රාශියක් මුල්කරගෙන රටේ වෘත්තීය සමිති හා තරුණ කණ්ඩායම් පෙළගැසී අගනුවර වන ටියුනිස් හිදී කැරලිගැසීම තුළින් මෙම විරෝධතා ව්‍යාපාරය දියත්විය. වසර **17** ක් තිස්සේ ජනාධිපතිව සිටි බෙන් අලි ( **Ben Ali** ) නම් පාලකයාට එරෙහිව තරුණ කණ්ඩායම්වල රාජ්‍ය විරෝධී ව්‍යාපාරයක් බවට ක්ෂණිකව මෙය හැරුණේ ය.

මෙම සිදුවීම් වලට බටහිර පුවත්පත් සේම **CNN, BBC, Fox News, Aljazeera** වැනි රූපවාහිනී නාලිකාද එක් වෙමින් පුවත් ලොව වටා ලැව්ගින්නක් සේ විහිදයාමට සැළැස්වූහ. ඒ ප්‍රදේශයේ තිබෙන විශාලම රටවල් වන ඊජිප්තු හා ලිබියාව අසළ ඇති කුඩා රටක් තුළ සිදුවන දේවලට එතරම් විශාල ප්‍රචාරයක් දුන්නේ ඇයිද යන්න එකල වුවද සැකපහල වන්නක් විය. ඒ කළකෝලහල ඒ ලොකු රටවල් දෙකටද යාවිය කියා ද, ඒ දෙරටේ තරුණ කණ්ඩායම් ද ඒවා ආදර්ශයට ගනිමින් ක්‍රියාත්මක වනු ඇතැයි ද යන නිසැක බලාපොරොත්තුව බටහිර රටවල ද, ඉහතකී මාධ්‍ය නාලිකා තුළ ද තිබෙන්නට ඇත.

වැඩි දවස් නොගොස්ම තුනීසියානු ජනාධිපති බෙන් අලි රටින් පිටුවහල්වීම අරමුණු කරගෙන රටින් පලාගියේය. රටේ පාලනය අගමැතිව සිටි මොහොමඩ් ගුනෝචිට (Mohammed Gunnauchi) ට බාරවිය. නව ව්‍යවස්ථාවක් සකසාගන්නා තුරු තාවකාලික ආණ්ඩුවක් යටතේ පාල නය ගෙනයැම ඔහු යෝජනා කළ නමුත් කැරළිකරුවන්ට උවමනාවූයේ පැරණි ක්‍රමයෙන් සම්පූර්ණයෙන්ම වෙන්වීමටය. අන්තිමේ දී අගමැති ගුනෝචි ද ඉල්ලා අස්වී පලාගියේය. කැරලිකරුවෝ තාවකාලික පාලනයක් පිහිටුවාගෙන ව්‍යවස්ථාදායක සභාවකට **2011** ජූලි වල ඡන්දයක් පැවැත්වී මට තීරණය කළහ. එහෙත් තුනීසියාවේ තවමත් පවතින්නේ අසහනකාරී, අවුල් සහගත අරාජික තත්වයකි.

## ඊජිප්තු කැරැල්ල

තුනීසියාවේ සිද්ධවුණු දේවල් ඊජිප්තුවටද බෝවුණා සේ කයිරෝ නගරයේ ඊජිප්තියානු තරුණ කණ්ඩායම් එම රජයට එරෙහිව කැරලිගැසීම ආරම්භ කළහ. ඊජිප්තුවේ ජනාධිපති හොස්නි මුබාරක්ගේ පාලනය වසර තිහක් පමණ එක දිගට පැවතුණකි. විටින් විට එහි ඡන්ද පවත්වා තිබුණද මේ වන විට ජනතාවට ඒවා එපාවී තිබුණි. උග්‍ර රැකියා හිඟය, අධික ජීවන වියදම, අඩුපඩු, හදිසිනීතිය යටතේ පාලනය, පොලිස් මැර කම්, දූෂණය, වංචනික දේශපාලනය ආදී දෙයින් හෙම්බත්වී සිටි ජනතාව තරුණ පෙළ සමග එක්වී කැරලි ගැසීම ඇරඹූහ. ඊජිප්තුවේ අගනුවර වන කයිරෝහි ටහිරීර් චතුරශ්‍රය ( **Tahirir Square**) රැස්වීම් මූලස්ථානය කරගත් කැරලිකරුවන් ප්‍රමුඛ මිලියන දෙකක් පමණ ජනකායක් උද්ඝෝෂණයට සම්බන්ධ වූ බව බටහිර මාධ්‍ය මගින් ප්‍රචාරය වීය.

අන්තිමේදී හමුදා සමග ගැටීම් වලින් කෙළවර වූ මේවායින් **6000** ක් පමණ තුවාල ලද අතර, **846** ක් මරුමුවට පත්වීයයි වාර්තාවුණි. එක් අවස්ථාවකදී මුබාරක් රජයේ අණදීම් වලට හමුදාව අවනත නොවූ නිසා පෙබරවාරි **11** වනදා මුබාරක්ට සහ ඔහුගේ අගමැතීන් දෙදෙනාට සිය පදවි අත්හරින්නට සිදුවීය. රටේ පාලනය හමුදා බලකායන්ගේ උත්තරීතර මණ්ඩලයකට පැවරිණ. අගමැති වරුන් දෙදෙනාගෙන් එක් කෙනෙක් පාලක මණ්ඩලයට එක්වූ අතර, මුබාරක් සහ අනෙක් අගමැති අත්අඩංගුවට ගැනුණි. ඔවුන්ට විරුද්ධව චෝදනා ළඟදී විභාග කෙරෙනු ඇතැයි කියැවේ. දැනට එම හමුදා මණ්ඩලය පාලනය ගෙනයයි.

**4 වන පිටුවට →**



**මලක් සුදෝ සුදු ගුවනින් පාවී එන ලෙසා**
**දිනක් පියාඹා ඇවිදින් මගෙ හිස මත වසා**
**එවක් පටන් පරෙවි මිතුරු ළඟ ගැවසෙන නිසා**
**සැකක් නැතේ මේ ලැබුවේ මට හොඳ කල දසා**

**Like a snow white flower arriving from the sky**
**Spreading wings, he soft landed on my head.**
**Since then he's staying very close to me in all climes**
**Surely this heralds a blessing; an arrival of better times.**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*

**Bradford Schoolgirl Rebekah Horsfield with her friendly dove - Snovy.**

***Photograph*** **(courtesy) Ross Perry**

පාසැල් ශිෂ්‍යාව රිබෙකා සහ ඇයගේ පරෙවි මිතුරා ස්නෝවි




අප සැමගේ විශ්වාසය දිනූ
FAST CASH
SEND TODAY - COLLECT TODAY


විස්තර පිටු අංක 3